රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 308

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1985 ඔක්තෝබර් මස 24 වැනිදින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**බීමත්කම හෝ මත්පැන් ගඳ වහනය වීම**

ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 2 වගන්තියේ විධිවිධාන පහත දැක්වේ:-

2:1 නිලධරයකු රාජකාරියෙහි නිරතව සිටියදී බීමත්ව සිටීම හෝ මත්පැන් ගඳ වහනය වීම එම නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හේතුවක් වන්නේය.

2:2 බීමත්ව සිටියදී කළ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ නිලධරයකු පළමු වතාවට උසාවියකදී වරදකරු බවට පමුණුවනු ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලබන්නේය.

2:3 බීමත්ව සිටීම හෝ මත්පැන් ගඳ වහනය වීම ගැන කරනු ලබන දෙපාර්තමේන්තු පරීක්ෂණයකදී නිලධරයකු වරද කළ බව තහවුරු කිරීමට මාණ්ඩලික මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් දෙදෙනෙකුගේ සාක්ෂි ප්‍රමාණවත් වන අතර, වරදකරු බවට ඔප්පු වුවහොත් එවිට එම නිලධරයා සේවයෙන් පහකරනු ලැබේ.

02. ඉහත උපුටා දක්වා ඇති 2:3 වගන්තියේ විධිවිධාන, සිය දෙපාර්තමේන්තු හෝ සංස්ථා භූමිභාගය තුළ ගැවසෙන කාර්ය වියුක්තව සිටින නිලධරයෙකු කෙරෙහිද අදාල විය යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.